## නිවේදන අංක:- R/2026/15

## උතුරු පළාත් රාජ්‍ය සේවයේ සමූපකාර සංවර්ධන නිලධාරි III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2026

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අංක DMS/CAD/NP/Gen./Vac.Fill. දරණ 2026.06.26 දිනැති අනුමැතිය සහ උතුරු පළාත් කාන්තා කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අංක NP/06/01/05/16 දරණ 2026.08.11 දිනැති ඉල්ලීම් ලිපිය යනාදිය ප්‍රකාරව උතුරු පළාත් රාජ්‍ය සේවයේ **සමූපකාර සංවර්ධන නිලධාරි III ශ්‍රේණියේ** පවතින පුරප්පාඩු විස්සක් **(20)** සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය, උතුරු පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් **2026 ඔක්තෝබර් මාසයේ දී** පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය **2026.09.18** වේ.

### 02. බඳවා ගැනීමේ සේවා කොන්දේසි

02.1. 2013.01.01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි උතුරු පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද **සමූපකාර සංවර්ධන නිලධාරි** තනතුරට අදාළ බඳවාගැනීමේ පරිපාටියේ කොන්දේසි හා විධිවිධාන සහ එහි සංශෝධනවලට අනුව සහ ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1817/30 දරණ 2013.07.03 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද උතුරු පළාත් රාජ්‍ය සේවය සඳහා වන කාර්ය පටිපාටික රීති සහ මෙම තනතුරට අදාළව කලින් කලට නිකුත් කරනු ලබන රෙගුලාසිවලට හා නියෝගවලට අනුකූලව තෝරාගන්නා අයදුම්කරුවන් **සමූපකාර සංවර්ධන නිලධාරි III වන ශ්‍රේණියට** බඳවා ගනු ලැබේ.

02.2. විවෘත තරඟ විභාගයෙන් සමත්වන, පත්වීමක් සඳහා සුදුසුකම් සම්පූර්ණ කරන අයදුම්කරුවන්, තම පත්වීම් දිනයේ සිට වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව **සමූපකාර සංවර්ධන නිලධාරි III ශ්‍රේණියට** පත්කරනු ලැබේ. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරකි. බඳවාගැනීමේ පරිපාටියේ සඳහන් පරිදි **සමූපකාර සංවර්ධන නිලධාරි III ශ්‍රේණියට** බඳවා ගත් දින සිට **වසර 03 ක්** ඇතුළත පළමු වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් ද පළමු වන දෙපාර්තමේන්තු විභාගයෙන් ද සමත් විය යුතුය.

02.3. සමූපකාර සංවර්ධන නිලධාරී තනතුරට පත් කරනු ලබන නිලධාරියෙකු, වසර තුනක (03) පරිවාස කාලය තුළදී, අවම වශයෙන් පැය 500 කින් සහ වසරකට නොඅඩු කාලසීමාවකින් සමන්විත වන, සමූපකාර සංවර්ධනයට අදාළ පූර්ණ කාලීන අධ්‍යයන පාඨමාලාවක් සම්පූර්ණ කළ යුතුය.

02.4. මෙම සේවය ස්ථානමාරුවලට යටත්වන සේවයකි. එබැවින් මෙම තනතුරට පත්කරනු ලබන අයදුම්කරුවන් "උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ යුතුය" යන කොන්දේසියට යටත් විය යුතුය.

02.5. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 සහ ඊට අනුෂාංගික චක්‍රලේඛවල සඳහන් විධිවිධාන අනුව පත්වීමේ දිනයේ සිට **වසර 03 ක්** අවසන් වීමට ප්‍රථම නියම කර ඇති දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතුය.

02.6. විවෘත තරඟ විභාගය මගින් බඳවා ගනු ලබන සේවක සංඛ්‍යාවේ සම්පූර්ණ එකතුව **විස්සකි (20)**. පත්වීම් සංඛ්‍යාව සහ ක්‍රියාත්මක වන දිනය යනාදිය පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලබයි. නිවේදනය කරනු ලැබූ පුරප්පාඩු අතරින් ඇතැම් පුරප්පාඩු හෝ පුරප්පාඩු සියල්ලම සම්පූර්ණ නොකර සිටීමේ බලය පත්වීම් බලධාරියා සතුය.

## 03. වැටුප් පරිමාණය

අංක 10/2025 දරණ 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි **MN 3-2025** වැටුප් කේතය අනුව **සමූපකාර සංවර්ධන නිලධාරි III ශ්‍රේණිය** සඳහා ඒකාබද්ධ වැටුප් පරිමාණය **රු.52,250 - 10 X 800 - 11 X 1,190 - 10 X 1,320 - 10 X 1,350 - 100,040/=** ක් වේ. (මෙම වැටුප් පරිමාණයේ සිව්වන පියවරට එළඹීමට ප්‍රථම පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය). කෙසේ වෙතත් ඉහත සඳහන් චක්‍රලේඛයේ **III වන උපලේඛනයෙහි** සඳහන් විධිවිධාන පරිදි නියම කරන ලද වැටුප මෙම තනතුර සඳහා ගෙවනු ලැබේ.

## 04. සාමාන්‍ය සුදුසුකම්

04.1. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

04.2. අයදුම්කරු උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක තම තනතුරට අදාළ රාජකාරි ඉටුකිරීමට හැකි යහපත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් හෙබි පුද්ගලයෙකු විය යුතු අතර, මනා හැසිරීමකින් යුතු අයෙකු විය යුතුය.

04.3. මෙම අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර හයක (06) කාලය තුළ අවම වශයෙන් නොකඩවා වසර තුනක (03) කාලයක් උතුරු පළාතේ පදිංචිව සිටිය යුතුය.

**(*සම්මුඛ පරීක්ෂණයේ දී තම ස්ථිර පදිංචිය තහවුරු කිරීම සඳහා ඡන්ද හිමි නාමලේඛනය ඉදිරිපත් කළ යුතුය)**

**එසේ නැතහොත්**

අයදුම්කරු හෝ ඔහුගේ දෙමාපියන් උතුරු පළාතේ උපන් අය විය යුතු අතර, උතුරු පළාතේ නොකඩවා අවම වශයෙන් වසර පහක (05) කාලයක් ස්ථිර පදිංචි අය විය යුතුය.

**(*සම්මුඛ පරීක්ෂණයේ දී තම ස්ථිර පදිංචිය තහවුරු කිරීම සඳහා ඡන්ද හිමි නාමලේඛනය ඉදිරිපත් කළ යුතුය)**

04.4. අයදුම්පත් භාරගන්නා **අවසන් දිනට හෝ ඊට පෙර මෙම තනතුරට අදාළ සියලුම සුදුසුකම්** අයදුම්කරු විසින් සපුරා තිබිය යුතුය.

04.5. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අයදුම්කරු වයස **අවුරුදු 18** ට නොඅඩු සහ වයස **අවුරුදු 30** ට නොවැඩි විය යුතුය.

## 05. සුදුසුකම්

### 05.1.අධ්‍යාපන සුදුසුකම්

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ/ඉංග්‍රීසි, **ගණිතය සමග වෙනත් විෂයයක් දෙකකට** සම්මාන සාමාර්ථ (Credit Pass) සහිතව විෂයයන් **හයකින් (06) එක් වරක දී** සමත්ව තිබිය යුතුය.

**සහ**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් ආර්ථික විද්‍යාව, කෘෂි විද්‍යාව, සංයුක්ත ගණිතය, ගණකාධිකරණය, ව්‍යාපාර සංඛ්‍යානය සහ ව්‍යාපාර අධ්‍යයනය යන විෂයයන්ගෙන් එක් විෂයයක් හෝ ඇතුළුව විෂයයන් තුනකින් (03) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) **එක් වරක දී** සමත්ව තිබිය යුතුය. (පැරණි විෂයය නිර්දේශය යටතේ නම් එක් වරක දී විෂයයන් තුනකින් (03) සමත්ව තිබීම ප්‍රමාණවත් වේ.)

### 05.2 වෘත්තීය සුදුසුකම්

අයදුම්කරු විසින් පොල්ගොල්ලේ පිහිටි ජාතික සමුපකාර සංවර්ධන ආයතනය (National Institute of Cooperative Development, Polgolla) මගින් පවත්වනු ලබන උසස් ගිණුම්කරණය (Higher Accountancy) / විගණනය (Auditing) / කළමනාකරණය (Management) යන පාඨමාලා අතුරින් එකක් සඳහා වන ඩිප්ලෝමාවක් ලබාගෙන තිබිය යුතුය; **එසේත් නොමැති නම්,** උතුරු පළාත් සමුපකාර පුහුණු ආයතනය මගින් පවත්වනු ලබන සමුපකාර සංවර්ධනය පිළිබඳ උසස් පාඨමාලාවක් සාර්ථකව සම්පූර්ණ කර තිබිය යුතුය.

**හෝ**

අයදුම්කරු ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ (Association of Accounting Technician of Sri Lanka - AAT) අවසාන (Final Stage) අදියර සමත් ව තිබිය යුතුය.

**හෝ**

අයදුම්කරු පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ දේශීය අධ්‍යාපන ආයතනයකින් හෝ දේශීයව පිහිටුවන ලද විදේශීය අධ්‍යාපන ආයතනයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විදේශීය අධ්‍යාපන ආයතනයකින් **ගිණුම්කරණය හෝ කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාවක්** ලබා තිබිය යුතුය.

**හෝ**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ (Chartered Accountancy Examination) අතරමැදි විභාගය (Intermediate Examination) සමත් වී තිබිය යුතුය.

**හෝ**

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ (Advanced Technological Institute) **ගිණුම්කරණය** (Accountancy) පිළිබඳ වසර 04 ක උසස් ඩිප්ලෝමා සහතිකය ලබා තිබිය යුතුය.

**හෝ**

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ (Advanced Technological Institute) ව්‍යාපාර පරිපාලනය (Business Administration) පිළිබඳ වසර 03 ක ඩිප්ලෝමා සහතිකය ලබා තිබිය යුතුය.

## **06.** බඳවා ගැනීමේ පරිපාටිය

06.1. ලිඛිත විභාගය මගින් කුසලතා පදනම මත, බඳවා ගන්නා අවස්ථාවේ දී බලපැවැත්වෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, බඳවාගැනීමේ පටිපාටිය, ජාතික සහ පළාත් ප්‍රතිපත්ති යනාදියට අනුව උතුරු පළාත් රාජ්‍ය සේවයේ **සමූපකාර සංවර්ධන නිලධාරි III ශ්‍රේණියට** බඳවා ගනු ලැබේ. මෙම දැන්වීමේ සඳහන් කර ඇති සුදුසුකම් සියල්ල සම්මුඛ පරීක්ෂණයේ දී පරීක්ෂා කරනු ලැබේ.

06.2. ඉහත සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන අයදුම්කරුවන් අතරින්, ලිඛිත පරීක්ෂණයෙන් සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් ලැබූ මුළු ලකුණු සංඛ්‍යාවේ කුසලතා අනුපිළිවෙළ අනුව පත්වීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයට තෝරා ගනු ලැබේ.

06.3. කෙසේ වෙතත්, ලිඛිත විභාගයෙන් ලබාගත් ලකුණුවල කුසලතා අනුපිළිවෙළ (Merit Order) අනුව සියලු සුදුසුකම් සපුරාලන අපේක්ෂකයින්, පවතින **පුරප්පාඩු සංඛ්‍යාවට අනුව** තෝරාගනු ලැබේ.

06.4. අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති බවට අනාවරණය වුවහොත් මෙම තනතුර සඳහා වූ හිමිකම් අවලංගු කරනු ලැබේ. මෙම දැන්වීම මගින් ඉල්ලා ඇති සියලුම සුදුසුකම්, ඒවා තහවුරු කෙරෙන ලේඛන පත්වීම් බලධාරියා විසින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයේදී පරීක්ෂා කරනු ලැබේ. නමුත්, සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු කිසිවක් ලබාදෙනු නොලැබේ.

06.5. උතුරු පළාත් කාන්තා කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අංක NP/06/01/05/16 දරණ 2026.08.18 දිනැති ලිපියෙන් නිර්දේශ කර ඇති පරිදි ඉහත 06.3 හි සඳහන් ආකාරයට බඳවා ගැනීම සඳහා තෝරා ගන්නා අයදුම්කරුවන්ගෙන් විශේෂ අවශ්‍යතා සහිතවූවන් (ආබාධ සහිත පුද්ගලයින්) සඳහා වෙන් වූ ප්‍රතිශතය, දෘෂ්ටි ආබාධ සහිත පුද්ගලයන් හැර අනෙකුත් පුද්ගලයන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 27/88 හි විධිවිධාන ප්‍රකාරව සලකා බලනු ලැබේ. අපේක්ෂකයෙකු පත්වීමක් සඳහා තෝරාගැනීමේ දී අදාළ තනතුරේ රාජකාරි ඉටුකිරීමට තම ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්ත්වය බාධාවක් නොවන බව විශේෂ වෛද්‍ය පරීක්ෂණයක් මගින් සනාථ කළ යුතුය.

<u>සටහන</u>

**අයදුම්කරු ආබාධ සහිත පුද්ගලයන් සඳහා වන පුනරුත්ථාපන තත්ත්වය යටතේ නියමිත පරිදි අයදුම් කරන බවට අයදුම්පත්‍රයේ සඳහන් කළ යුතු අතර, ආබාධිත පුද්ගලයෙකු නොවන අයදුම්කරුවෙකු තමා ආබාධිත පුද්ගලයෙකු බවට සඳහන් නොකළ යුතුයි.**

## **07.** විභාග ගාස්තු

අයදුම්කරු, විභාග ගාස්තු ලෙස **රු.500/=** මුදලක් උතුරු පළාතේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත"** යන නමට ගෙවා, අදාළ ලදුපත අයදුම්පතෙහි අදාළ කොටුවේ නොගැළවෙන පරිදි අලවා එවිය යුතුය. කුමන හේතුවක් නිසා හෝ මෙම ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. මෙම ගාස්තුව වෙනත් විභාග සඳහා මාරු කිරීමට ද අනුමත කරනු නොලැබේ.

## **08.** අයදුම්කිරීමේ පිළිවෙල

08.1. මෙම දැන්වීම සමග නිකුත් කරනු ලබන අයදුම්පත www.np.gov.lk උතුරු පළාත් සභාවේ නිල වෙබ් අඩවිය වෙත පිවිස බාගත කරගෙන, එය සම්පූර්ණ කර **අයදුම්පත් භාරගන්නා අවසාන දින හෝ ඊට පෙර** ලැබෙන පරිදි **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 393/48, කෝවිල පාර, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමුකළ යුතුය.

08.2. ඉල්ලුම්පත්‍ර බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"NP/07/10/01/235 "** යනුවෙන් සඳහන් කළ යුතුය.

08.3. ඉල්ලුම්පත්‍රයේ පිටපතක් තබාගැනීම ප්‍රයෝජනවත් විය හැකිය. ඉල්ලුම්පත්‍රයේ පිටපත් සහ ප්‍රගමන පිටපත් යනාදිය භාරගනු නොලැබේ. විභාගය සඳහා ප්‍රවේශ පත්‍රය පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් එවනු ලැබේ. කෙසේ වෙතත්, **විභාග ප්‍රවේශ පත්‍රය එවීමෙන්, අයදුම්කරු සියලු සුදුසුකම් සපුරා ඇති බවට අදහස් නොකෙරේ.**

08.4. අයදුම්පත් ඉදිරිපත් කරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් ලැබුණු බවට කිසිදු දැනුම්දීමක් කරනු නොලැබේ. තවද අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පෙර, ඉල්ලා ඇති සුදුසුකම් සම්පූර්ණ නොකරන අයදුම්පත් කිසිදු පෙර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබිය හැක.

08.5. ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් විභාගය පැවැත්වෙන දිනට අවම වශයෙන් දින 05 කට වත් පෙර විභාගය ප්‍රවේශ පත්‍රය නොලැබුණේ නම්, ඒ බව පහත සඳහන් විස්තර සහිතව **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 393/48, කෝවිල පාර, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට දැන්විය යුතුය. (දුරකතන අංකය - **021-2219939** / ෆැක්ස් අංකය - **021-2219940** / විද්‍යුත් තැපෑල - **examppscnp@gmail.com**)

- විභාගයේ නම
- අයදුම්කරුගේ සම්පූර්ණ නම
- ජාතික හැඳුනුම්පත් අංකය
- අයදුම්කරුගේ තැපැල් ලිපිනය
- අයදුම්කරුගේ විද්‍යුත් තැපැල් ලිපිනය
- අයදුම්පතේ පිටපතක්
- අයදුම්පත තැපැල් කළ තැපැල් කාර්යාලය, ලියාපදිංචි තැපෑලේ අංකය සහ දිනය
- විභාග ගාස්තු ගෙවා ලබාගත් ලදුපතේ සහතික කළ පිටපතක්

## **09.** පුද්ගල අනන්‍යතාව තහවුරු කිරීම

09.1 අයදුම්කරුවන් තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහා ම විභාග ශාලාධිපති සෑහීමකට පත්විය හැකිවන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් කුමන හෝ ලේඛනවලින් එකක් පිළිගනු ලැබේ.

(i). පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත

(ii). වලංගු ශ්‍රී ලංකා විදේශ ගමන් බලපත්‍රය

(iii). වලංගු ශ්‍රී ලංකා රියදුරු බලපත්‍රය

ඉහත සඳහන් ලියවිලිවලින් අතරින් එකක් හෝ විභාගයට පෙනී සිටීමේ දී ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අපේක්ෂකත්වය **"උතුරු පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ"** අභිමතය පරිදි අවලංගු කළ හැකිය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පනවනු ලබන රෙගුලාසිවලට අයදුම්කරුවන් යටත් විය යුතුය. එකී නීති රීතිවලට පටහැනිව කටයුතු කළහොත් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පනවනු ලබන දඬුවමකට යටත් විය යුතුය.

09.2 තවද, අයදුම්කරුවන්ගේ අනන්‍යතාවය තහවුරු කර ගත හැකි පරිදි මුහුණ සහ ඉලෙක්ට්‍රෝනික උපාංග පැළඳ නොසිටින බව තහවුරු කරගැනීම සඳහා කන් දෙකම ආවරණය නොකර විභාග ශාලාවට ඇතුළු විය යුතුය. තවද, එසේ තහවුරු කරගැනීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කරනු නොලැබේ. තවද, විභාග ශාලාවට ඇතුළත්වූ මොහොතේ සිට විභාගය අවසන් වී විභාග ශාලාවෙන් පිටත්ව යන තුරු අයදුම්කරුගේ අනන්‍යතාවය තහවුරු වන ආකාරයෙන් මුහුණ සහ කන් දෙක ආවරණය නොකර සිටිය යුතුය.

## 10. අසත්‍ය තොරතුරු සඳහා දඬුවම්

අයදුම්කරු තම ඉල්ලුම්පත්‍රය සම්පූර්ණ කිරීමේ දී ඉතා සැළකිලිමත්ව නිවැරදි තොරතුරු ඉදිරිපත් කළ යුතුය. මෙම විභාගයේ රෙගුලාසිවලට අනුව කිසියම් අයදුම්කරුවෙකු විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන විට හෝ විභාගයෙන් පසුව කුමන හෝ අවස්ථාවක සුදුසුකම් නොමැති අයෙකු බව අනාවරණය වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය එම අවස්ථාවේ දී ම අවලංගු කරනු ලැබේ. අයදුම්කරු ඉදිරිපත් කර ඇති කුමන හෝ තොරතුරක් අසත්‍ය බව අනාවරණය වන කුමන හෝ අවස්ථාවක හෝ ඔහු/ඇය පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ඇත.

## 11. අත්සන සහතික කිරීම

සෑම අයදුම්කරුවෙකුම තමන්ගේ අත්සන සහතික කිරීම අනිවාර්යය වේ. අයදුම්කරුවන් තම අත්සන කොට්ඨාශයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සමාදාන විනිශ්වයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි ලත් නිලධාරියෙකු, රු.854,880.00 ට නොඅඩු මාසික වැටුපක් ලබන ළඟම ඥාතියෙකු නොවන ස්ථිර රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය නිලධාරියෙකු, බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැළකිය යුතු තත්ත්වයක් දරණ අයෙකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

## 12. විභාග පරිපාටිය

මෙම ලිඛිත පරීක්ෂණය පහත සඳහන් **ප්‍රශ්න පත්‍ර 02 න්** සමන්විත වන අතර, මෙම විභාගය සිංහල සහ දෙමළ යන භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අයදුම්කරුවන් තමන්ට අදාළ භාෂා මාධ්‍යයක් තෝරාගත යුතු අතර, විභාගයට අදාළ සියලුම ප්‍රශ්නපත්‍ර වලට එම භාෂා මාධ්‍යයෙන්ම පිළිතුරු සැපයිය යුතුය. අයදුම් කරන ලද භාෂාව පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| අනු අංකය | ප්‍රශ්න පත්‍රය | විෂයය අන්තර්ගතය | කාලය | ලකුණු |
|---|---|---|---|---|
| 01 | බුද්ධි පරීක්ෂණය | මෙම ප්‍රශ්න පත්‍රය, අපේක්ෂකයින්ගේ සිතීමේ තර්කානුකූලභාවයන් ද විශ්ලේෂණ හැකියාවන් ද තීරණ ගැනීමේ ශක්තීන් ද විනිශ්චය කිරීම සඳහා බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීම් වලින් ප්‍රශ්න 50 කින් සමන්විත වූ ප්‍රශ්න පත්‍රයකි. | පැය 01 | 100 |
| 02 | සාමාන්‍ය දැනීම | මෙම ප්‍රශ්න පත්‍රය,<br><br>(අ) ජාතික හා ජාත්‍යන්තර දේශපාලන, සමාජ, ආර්ථික හා සංස්කෘතික දැනුම<br><br>(අ) සමූපකාර දර්ශනය හා ව්‍යාපාර පිළිබඳ දැනුම බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීම් වලින් ප්‍රශ්න 50 කින් සමන්විත වූ ප්‍රශ්න පත්‍රයකි. | පැය 01 | 100 |

<u>සටහන</u>

මෙම විභාගය තරඟ විභාගයක් වන හෙයින් සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට සුදුසුකම් ලැබීමට නම් එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා වෙන් කර ඇති ලකුණුවලින් අවම වශයෙන් සියයට **හතළිහක් (40%)** ලබාගත යුතු වේ. සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරුවන් මෙම තරඟ විභාගයෙන් අයදුම්කරුවන් ලබාගත් මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල (Merit Order) සළකා බලනු ලැබේ.

## 13. විභාග මධ්‍යස්ථානය

13.1 විභාගය පැවැත්වීමට බලාපොරොත්තුවන විභාග නගර සහ නගර අංක පහත දැක්වේ.

| නගරය | නගර අංකය |
|---|---|
| යාපනය | 01 |
| වවුනියාව | 02 |
| කිළිනොච්චි | 03 |

13.2 තෝරාගත් විභාග මධ්‍යස්ථානයක් සඳහා ප්‍රමාණවත් අයදුම්පත් සංඛ්‍යාවක් නොලැබුණහොත්, මෙම විභාගය ආසන්න මධ්‍යස්ථානයකට හෝ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන මධ්‍යස්ථානයකට මාරු කිරීමට ඉඩ ඇත.

## 14. විභාග ප්‍රතිඵල

අපේක්ෂකයින්ගේ අවසන් විභාග ප්‍රතිඵල උතුරු පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් උතුරු පළාත් සභාවේ නිල වෙබ් අඩවිය (www.np.gov.lk ) හරහා නිකුත් කරනු ලබන අතර, www.np.gov.lk ⟶ **Exams & Recruitments** ⟶ **Results** යන සබැඳිය වෙත පිවිසීමෙන් අපේක්ෂකයින්ට තම තනි පුද්ගල ප්‍රතිඵල සහතික නැරඹීමට සහ බාගත කිරීමට හැකියාව ඇත.

**<u>සැළකිය යුතුය</u>**

i. මෙම විභාග දැන්වීමෙහි සඳහන් නොවන මොනයම් හෝ කරුණක් පිළිබඳව උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ තීරණය අවසන් තීරණය වේ.

ii. මෙම විභාගය පැවැත්වීම හෝ අවලංගු කිරීම පිළිබඳ සම්පූර්ණ බලය උතුරු පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් සතුය.

iii. මෙම කරුණ සම්බන්ධයෙන් කිසියම් පැහැදිළි කරගැනීමක් අවශ්‍ය වන්නේ නම් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විභාග අංශයේ දුරකතන අංක 021-2219939 සමග සම්බන්ධ වන්න.

iv. මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් හෝ නොගැළපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක දෙමළ මාධ්‍ය නිවේදනය බලාත්මක වන බව සැළකිය යුතුය.

v. මෙම විභාගය පිළිබඳ නිවේදනය www.np.gov.lk උතුරු පළාත් සභාවේ නිල වෙබ් අඩවියට පිවිසීමෙන් ලබාගත හැකිය.

**ආල්වාප්පිල්ලෛ සිරි**
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
උතුරු පළාත
**2026.08.31**